# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1950/27 - 2016 ජනවාරි මස 19 වැනි අඟහරුවාදා - 2016.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(x).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ලියාපදිංචි අංක පී. බී. 4833 සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින් මෙහි I වන (නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව) හා II උපලේඛනවල II වන තීරයේ වූ අනුරූප සටහන්වල කෙටි යෙදුම්වල නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනවල I වන තීරයේ නිශ්චිතව දැක්වෙන උපාධි සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් එහි උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස එම නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් යන ආයතනය පිළිගෙන සිටිමි.

### I උපලේඛනය

*අදාළ කොන්දේසි*

1. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමටඩ් ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත්වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යාපන පොදු සහතිකපත්‍ර උසස්පෙළ විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම යන සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට ලිමිටඩ් ආයතනය, මෙම නියෝග පළ කරනු ලබන දින සිට මාස 3 ක් ඇතුළත සිසුන් සඳහා ප්‍රමාණවත් පරිගණක සංඛ්‍යාවක් ලබා දිය යුතු අතර අදාළ අධිකාරිය වෙත ඒ බව දැනුම් දිය යුතු ය.

| *I වන තීරය*<br>*උපාධි* | *II වන තීරය*<br>*උපාධි සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| ව්‍යාපාර සන්නිවේදනය පිළිබඳ කලා උපාධිය | බී ඒ (ව්‍යාපාර සන්නිවේදනය)<br>BA (Business Communication) |

**II උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| බහුමාධ්‍ය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | බී එස් සී (බහුමාධ්‍ය)<br>BSc (Multimedia) |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (මානව සම්පත් කළමනාකරණය) (විශේෂ) උපාධිය | බී එස් සී බී එම් (එච් ආර් එම්) විශේෂ<br>BSc BM (HRM) Sp. |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (කාර්ය සම්පාදන කළමනාකරණය) (විශේෂ) උපාධිය | බී එස් සී බී එම් (එල් එම්) විශේෂ<br>BSc BM (LM) Sp. |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (කර්මාන්ත කළමනාකරණය) (විශේෂ) උපාධිය | බී එස් සී බී එම් (අයි එම්) විශේෂ<br>BSc BM (IM) Sp. |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ව්‍යාපෘති කළමනාකරණය) (විශේෂ) උපාධිය | බී එස් සී බී එම් (පී එම්) විශේෂ<br>BSc BM (PM) Sp. |
| කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | බී එස් සී (එම් අයි එස්) විශේෂ<br>BSc MIS Sp. |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (බී එම්)<br>PG Dip (BM) |
| මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (එච් ආර් එම්)<br>PG Dip (HRM) |
| කර්මාන්ත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (අයි එම්)<br>PG Dip (IM) |
| ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (පී එම්)<br>PG Dip (PM) |
| පරිගණක ජාල පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (සී එන්)<br>PG Dip (C N) |
| මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (එස් ඉ)<br>PG Dip (SE) |

නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ 25 අ වගන්තිය යටතේ සාදන ලද 2013 මාර්තු මස 5 දිනැති සහ අංක 1800/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නියමය, යටතේ නීත්‍යානුකූලව කරන ලද කිසිවකට අගතිවිරහිතව එකී නියමය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

02 - 111

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.